**විසර්ජන ශීර්ෂය - 175 - රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය**

**විගණකාධිපති වාර්තාව - 2012 වර්ෂය**

1.1 විගණන විෂය පථය

-----------------------

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ 2012 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය වාර්තා, සැසඳුම් ප්‍රකාශන පොත්පත්, ලේඛන හා අනෙකුත් වාර්තා අන්තර්ගත වූ විසර්ජන ගිණුම ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන යටතේ විගණනය කරන ලදී. සමාලෝචිත වර්ෂය සඳහා වූ කළමනාකරණ විගණන වාර්තාව 2013 ජූනි 28 දින අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත නිකුත් කරන ලදී. ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ විගණන නිරීක්ෂණ, අදහස් දැක්වීම් සහ සොයා ගැනීම්, විගණනය සඳහා ඉදිරිපත් කරන ලද ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළිබඳ සමාලෝචනය සහ ගනුදෙනු වල නියැදි පිළිබඳ තහවුරු පරීක්ෂා කිරීම් මත පදනම් වී ඇත. එම සමාලෝචනය හා පරීක්ෂණයන්ගේ විෂය පථය සහ ප්‍රමාණය, මට ලැබී ඇති කාර්ය මණ්ඩලය, අනෙකුත් සම්පත් හා කාලවේලා යන සීමාවන් ඇතුළත හැකිතාක් පුළුල් විගණනයක් කළ හැකි වන පරිදි පිළියෙල කරන ලද්දකි.

1.2 ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම

------------------------------------------------------------------------------------------

විසර්ජන ගිණුම, හා සැසඳුම් ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 148,149,150 හා 152 ව්‍යවස්ථාවන්, වෙනත් ව්‍යවස්ථාපිත විධිවිධානයන්, රාජ්‍ය මූල්‍ය හා පරිපාලන රෙගුලාසි වලට අනුකූලව පවත්වා ගෙන යාම, පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම ප්‍රධාන ගණන් දීමේ නිලධාරීගේ වගකීම වේ. වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ ගිණුම් හා සැසඳුම් ප්‍රකාශන පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන අභ්‍යන්තර පාලනයන් සැලසුම් කිරීම, ක්‍රියාත්මක කිරීම සහ පවත්වා ගෙන යාමත් මෙම වගකීමට ඇතුළත් වේ.

1.3 විගණන නිරීක්ෂණ

-----------------------

2012 දෙසැම්බර් 31 දිනට මූල්‍ය වාර්තා හා පොත් අනුව රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශයේ විසර්ජන ගිණුම හා සැසඳුම් ප්‍රකාශ මෙහි (අ) සිට (ඇ) දක්වා වූ පොදු නිරීක්ෂණ සහ පහත 1.4 සිට 1.10 දක්වා ඡේදවල සඳහන් ප්‍රධාන විගණන සොයා ගැනීම් හැර සතුටුදායක ලෙස පිළියෙල කර ඇති බව නිරීක්ෂණය විය.

**(අ) විසර්ජන ගිණුම**

**(i) මුළු ප්‍රතිපාදනය හා වියදම**

සමාලෝචිත වර්ෂය සඳහා අමාත්‍යාංශය සඳහා සලසා තිබුණු මුළු ශුද්ධ ප්‍රතිපාදනය රු.218,608,217 ක් වූ අතර වර්ෂය අවසාන වන විට ඉන් රු.128,387,439 ක් උපයෝජනය කර තිබුණි. ඒ අනුව ශුද්ධ ඉතිරිවීම් රු.90,220,778 ක් වී තිබුණු අතර, එය මුළු ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 41 ක ප්‍රතිශතයක් ගෙන තිබුණි. විස්තර පහත දැක්වේ.

| වියදමේ ස්වභාවය | 2012 දෙසැම්බර් 31 දිනට ඇස්තමේන්තුගත ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ශුද්ධ ප්‍රතිපාදනය | 2012 දෙසැම්බර් 31 දිනට ඉතිරිය | ඉතිරිය ශුද්ධ ප්‍රතිපාදනයේ ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|---|---|
| | රු. | රු. | රු. | % |
| පුනරාවර්තන | 106,515,000 | 101,050,344 | 4,244,433 | 4 |
| මූලධන | 104,600,000 | 117,557,873 | 85,976,345 | 73 |
| එකතුව | 211,115,000 | 218,608,217 | 90,220,778 | |

(ii) අයවැය විචලනය

* වැය විෂයයන් 02 ක් සඳහා සලසා තිබුණු රු.80,300,000 ක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබුණි.

* වැය විෂයයන් 05 ක් සඳහා අධි ප්‍රතිපාදන සලසා තිබීම හේතුවෙන් ප්‍රතිපාදන උපයෝජනය කිරීමෙන් පසු ඉතිරිය එම වැය විෂයන්ට අදාල ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 57 ත් සියයට 83 ත් අතර පරාසයක ප්‍රතිශතයක් ගෙන තිබුණි.

**(ආ) රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම්**

**පාර්ලිමේන්තුව විසින් පනවා තිබුණු සීමාවන්**

විෂය අංක 17501 දරන රජයේ නිලධාරීන්ට අත්තිකාරම් ගිණුම වෙනුවෙන් පාර්ලිමේන්තුව පනවා තිබුණු සීමාවන් හා තථ්‍ය අගයන් පහත දැක්වේ.

| වියදම | | ලැබීම් | | හර ශේෂය | |
|---|---|---|---|---|---|
| උපරිම සීමාව | තථ්‍ය | අවම සීමාව | තථ්‍ය | උපරිම සීමාව | තථ්‍ය |
| රු. | රු. | රු. | රු. | රු. | රු. |
| 5,000,000 | 2,421,886 | 1,500,000 | 1,894,570 | 20,000,000 | 10,725,555 |

**(ඇ) පොදු තැන්පත් ගිණුම**

2012 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ පොදු තැන්පත් ගිණුම්වල ශේෂවල එකතුව රු.4,202,532 ක් වූ අතර, ඒ පිළිබඳ විස්තර පහත දැක්වේ.

| ගිණුමේ අංකය | 2012 දෙසැම්බර් 31 දිනට ශේෂය |
|---|---|
| | රු. |
| 15/78 | 4,202,532 |

වර්ෂ 2 ක් ඉක්මවූ රු.447,853 ක් වූ තැන්පතු 2 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි 571 ප්‍රකාරව කටයුතු කර නොතිබුණි.

## 1.4 යහපාලනය හා ගිණුම්කටයුතුභාවය

### 1.4.1 සංයුක්ත සැලැස්ම

සියළුම අමාත්‍යාංශ ලේකම්වරුන්, පළාත් සභා ප්‍රධාන ලේකම්වරුන්, දෙපාර්තමේන්තු ප්‍රධානීන්, දිස්ත්‍රික් ලේකම්වරුන් හා පළාත් පාලන ආයතන ප්‍රධානීන් අමතන ලද 2010 මාර්තු 10 දිනැති අංක පීඑෆ්/ආර්/2/2/3/5(4) දරන රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්ගේ ලිපිය ප්‍රකාරව 2010 ර්‍ෂයේ සිට ඉදිරියට අවම වශයෙන් වර්ෂ 03 ක් සඳහා සංයුක්ත සැලැස්මක් අමාත්‍යාංශය විසින් වර්ෂය ආරම්භයේදී පිළියෙල කළයුතු වුවත්, එම සැලැස්ම 2012 වර්ෂය සඳහා පිළියෙල කර නොතිබුණි.

### 1.4.2 වාර්ෂික කාර්ය සාධන වාර්තා

ඉහත 1.4.1 ඡේදයෙහි සඳහන් රාජ්‍ය මුදල් අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ ලිපියේ සඳහන් 2002 සැප්තැම්බර් 12 හා 2004 පෙබරවාරි 20 දින දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛ 402 හා 402(1) ප්‍රකාර මුදල් වර්ෂය අවසන් වී දින 150 ක් ඇතුළත අමාත්‍යාංශය විසින් පිළයෙල කළ යුතු වාර්ෂිත කාර්ය සාධන වාර්තාව විගණකාධිපතිට පිටපතක් සහිතව පාර්ලිමේන්තුවේ සභාගත කළයුතු වුවත්, සමාලෝචිත වර්ෂයට අදාල කාර්යසාධන වාර්තාව 2013 ජූලි 31 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

### 1.4.3 අභ්‍යන්තර විගණනය

කාර්ය මණ්ඩලය දෙදෙනෙකුගෙන් සමන්විත අභ්‍යන්තර විගණන ඒකකයක් තිබුණද, ප්‍රමාණවත් අභ්‍යන්තර විගණනයක් කර නොතිබුණි. 2012 වර්ෂය සඳහා අමාත්‍යාංශය සම්බන්ධයෙන් එක් විගණන වාර්තාවක් පමණක් නිකුත් කර තිබුණි.

## 1.5 වත්කම් කළමනාකරණය

### (අ) බේරුම් නොකළ බැරකම්

අමාත්‍යාංශය විසින් 2012 දෙසැම්බර් 31 දිනට බේරුම් නොකළ බැරකම් රු.14,646,550 ක් වූ අතර, එම ශේෂය අවුරුදු 1 කට වඩා අඩු කාලපරිච්ඡේදයකට අයත් විය.

* විසර්ජන ගිණුමේ දක්වා තිබූ බැරකම් පියවීම සඳහා සමාලෝචිත වර්ෂයේ ඉතිරිකිරීම් ප්‍රමාණවත් නොවූ වැය විෂයයන් 5 ක් අනාවරණය විය.

## 1.6 අනුකූල නොවීම්

### (අ) නති,රීති,රෙගුලාසි යනාදියට අනුකූල නොවීම.

නියැදි විගණන පරීක්ෂණ වලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසි වල විධි විධාන වලට අනුකූල නොවූ අවස්ථා විග්‍රහ කර පහත දැක්වේ.

| | නීති,රීති හා රෙගුලාසි වලට යොමුව | වටිනාකම | අනුකූල නොවීම |
|---|---|---|---|
| | | රු. | |
| | මුදල් රෙගුලාසි | | |
| | මු.රෙ 371 | 177,098 | අතුරු අග්‍රිමයක් එය දෙන ලද කාර්ය නිම වූ වහාම පියවිය යුතු වුවද ප්‍රමාද වී පියවා තිබූ අවස්ථා 14 ක් නිරීක්ෂණය විය. |
| | රාජ්‍ය මුදල් චක්‍රලේඛ | | |
| | ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය / අත්පොත | | |
| (i) | 3.5 (ඇ) ඡේදය | 159,700 | මෙම ඡේදයේ සඳහන් විශේෂ අවස්ථානුගත කරුණු වලින් පරබාහිරව සෘජු කොන්ත්‍රාත් ක්‍රමය යටතේ මිලදී ගැනීම් සිදු කර තිබුණි. |

## 1.7 මතභේදයට තුඩුදෙන ගණුදෙනු

**දිවිනැගුම නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානය පිහිටුවීම - ලක්සල ආයතනය**

රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය යටතේ ඇති ලක්සල ආයතනයේ දිවිනැගුම නිෂ්පාදන අලෙවි මධ්‍යස්ථානයක් ආරම්භ කිරීම සඳහා රු.100,000,000 ක ප්‍රතිපාදන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය මගින් අනුමත කර තිබුණි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(i) ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය විසින් රු.75,000,000 ක ප්‍රතිපාදන නිදහස් කර නොතිබියදී භාණ්ඩාගාරයෙන් ඒ සඳහා අත් මුදල් ලබාගෙන ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ වැය ශීර්ෂයට

හර කරමින් රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් ලක්සල ආයතනය වෙත මුදල් ගෙවා තිබුණි.

(ii) මේ සම්බන්ධයෙන් අදාල වූ 2012 දෙසැම්බර් 04 දිනැති අංක 39/2012 දරන අමාත්‍ය මණ්ඩල සංදේශය පරිදි රාජ්‍ය සම්පත් හා ව්‍යවසාය සංවර්ධන අමාත්‍යාංශය විසින් ලක්සල ඉංජිනේරු අංශය වෙතින් මෙම කටයුතු කිරීමේ හැකියාව පිළිබඳ සෑහීමකට පත්වන්නේ නම් එමඟින් ඉදිකිරීම් අමාත්‍යාංශයේ පූර්ණ අධීක්ෂණය යටතේ මූල්‍ය විනිවිදභාවයකින් යුතුව නිමකළ යුතු බව මුදල් අමාත්‍යාංශයේ නිරීක්ෂණවල දක්වා තිබුණි. එසේ වුවද,

(a) ඉදිරිපත් කර තිබූ ඇස්තමේන්තු ලක්සල ඉංජිනේරු අංශයෙන් පිළියෙල කළ ඒවා බවට විගණනයේදී තහවුරු නොවුණි.

(b) අමාත්‍යාංශය විසින් ලක්සල ඉංජිනේරු අංශයක් ක්‍රියාත්මක තත්ත්වයේ පවතීද, එහි කාර්ය මණ්ඩලයේ සංඛ්‍යාව හා ඔවුන්ගේ සුදුසුකම්, එහි සම්පත් ප්‍රමාණය, කලින් නිම කර ඇති කාර්යයන් වල ස්වභාවය පිළිබඳ නිසි අධ්‍යයනයක් සිදුකර නොතිබුණි.

## 1.8 අවිධිමත් ගනුදෙනු

අමාත්‍යාංශය විසින් එළඹ තිබුණු සමහර ගනුදෙනු විධිමත් බවෙන් තොර විය. නිරීක්ෂණය වූ එවැනි අවස්ථා කිහිපයක් පහත දැක්වේ.

ප්‍රසම්පාදන මාර්ගෝපදේශ ක්‍රියා පටිපාටීන් බැහැර වීම.

දැයට කිරුළ ජාතික ප්‍රදර්ශන භූමිය තුළ ප්‍රදර්ශන කුටිය ඉදිකිරීම

(අ) රු.5,400,000 ක වියදමක් දරා තිබුණද තරඟකාරී මිල ගණන් කැඳවීම් නොකර කොන්ත්‍රාත්කරු තෝරාගෙන තිබුණි.

(ආ) ප්‍රසම්පාදන අත්පොත සඳහා වූ අතිරේක අංක 20 (ii) ඡේදය ප්‍රකාරව ප්‍රසම්පාදන කාර්ය පටිපාටියෙන් බැහැරව තටයුතු කර තිබුණද, මෙම කාර්ය ඉතා හදිසිවූද, ඉතා විශේෂ වූද කාර්යයක් නොවන බව නිරීක්ෂණය විය.

(ඇ) ටෙන්ඩර් පරිපාටියෙන් බැහැර වීමේදී ඊට හේතු පැහැදිලිව ලියා විගණකාධිපතිටද පිටපත් යැවිය යුතු වුවත් එසේ සිදු කර නොතිබුණි.

(ඈ) ටෙන්ඩර් මණ්ඩල අනුමැතිය ලබාදීමට පෙර අත්තිකාරම් ගෙවා තිබුණි.

(ඉ) අවසාන ගෙවීම් කිරීමට හෝ මේ සම්බන්ධයෙන් පරීක්ෂා කර වාර්තාවක් කිරීම සඳහා කමිටුවක් පත් කර තිබූ අතර, එම කමිටු වාර්තාව අනුව ඇස්තමේන්තුවේ සඳහන් යම් යම් අයිතමයන් සිදුකර නොමැති බව වාර්තා වී තිබුණද ඒ සඳහා කිසිඳු අඩුකිරීමක් සිදු නොකොට මුළු ඇස්තමේන්තු මුදලම ගෙවා තිබුණි.

(ඊ) කුටිය සඳහා යොදා තිබුණු යකඩ රාමු සඳහා ඇස්තමේන්තුවේ මිල ගණන් ලබා දී තිබුණු අතර, ඒ සඳහා ගෙවීම් කර තිබියදී කොන්ත්‍රාත්කරු විසින් ඒවා ගලවාගෙන ගොස් නොතිබුණි.

(ඉ) කමිටු වාර්තාව අනුව ආවරණ සියල්ල අමාත්‍යාංශය යටතේ ඇති වෙනත් ආයතනයක් වෙත ගලවාගෙන යාමට උපදෙස් දුන් බව සඳහන් කර තිබුණද එම ආයතනය විසින් ඒවා භාරගත් බවට සාක්ෂි නොතිබුණි.

**1.9 පාඩු හා හානි**

2012 වර්ෂය තුළදී වාහන 04 ක් අනතුරු වලට ලක් වීම හේතුවෙන් අළුත්වැඩියා වශයෙන් රු.1,205,727 ක මුදලක් වියදම් දරා තිබුණි.

**1.10 මානව සම්පත් කළමනාකරණය**

**(අ) අනුමත සේවක සංඛ්‍යා හා තථ්‍ය සේවක සංඛ්‍යා**

2012 දෙසැම්බර් 31 දිනට වූ සේවක සංඛ්‍යාව පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| | සේවක වර්ගය | අනුමත සේවක සංඛ්‍යාව | තථ්‍ය සේවක සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|---|
| (i) | ජ්‍යෙෂ්ඨ මට්ටම | 19 | 15 | 04 |
| (ii) | තෘතියික මට්ටම | 03 | 03 | - |
| (iii) | ද්විතියික මට්ටම | 56 | 36 | 20 |
| (iv) | ප්‍රාථමික මට්ටම | 33 | 33 | - |
| (v) | වෙනත් (අනියම්/තාවකාලික/කොන්ත්‍රාත් පදනම) | 03 | 01 | 02 |
| | එකතුව | 114 | 88 | 26 |

සමාලෝචිත වර්ෂය අවසාන වන විට පුරප්පාඩු 26 ක් පිරවීමට අපොහොසත් වී තිබුණි.